ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2023(2024 මාර්තු)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024 மார்ச்)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2023 (March 2024)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුය :**
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.

පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

ආහාර තාක්ෂණවේදි උපාධිධාරියකු වන සිරි, දේශීය නැවුම් පළතුරු අලෙවිකරණ වෙළෙඳ සැලක් පවත්වාගෙන යන්නී ය. ඔහු ප්‍රදේශයේ සිටින කාබනික පොහොර භාවිත කර පළතුරු වගා කරන ගෙවීන්ගෙන් පළතුරු මිල දී ගෙන, ඒවා තිලකගේ ආපන ශාලාවට හා පාරිභෝගිකයන්ට අලෙවි කරයි.

01. සිරිගේ පළතුරු වෙළඳ සල විසින් සපුරාලනු ලබන වුවමනාවක් වන්නේ,
(i) ආහාර ය. (ii) ජෑම් ය. (iii) අඹ ය. (iv) සෞඛ්‍ය ය.

02. මෙම සිද්ධියේ සඳහන් සිරිගේ පළතුරු ව්‍යාපාරය,
(i) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. (ii) සේවා සපයන ව්‍යාපාරයකි
(iii) ලාභ අරමුණුකර නොගත් ව්‍යාපාරයකි (iv) හවුල් ව්‍යාපාරයකි.

03. සිරිගේ ව්‍යාපාරයේ ශක්තියක් වන්නේ,
(i) සිරි ආහාර තාක්ෂණවේදි උපාධිධරයෙක් වීම.
(ii) සිරිට ඉලක්ක වෙළෙඳ පොලක් තිබීම.
(iii) අවට ආපන ශාලාවක් තිබීම ය.
(iv) කාබනික පොහොර භාවිත කර පළතුරු නිෂ්පාදනය කරන ගොවීන් සිටීම ය.

04. තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම ව්‍යාපාරයට,
(i) ශක්තියකි. (ii) අවස්ථාවකි. (iii) දුර්වලතාවයකි. (iv)තර්ජනයකි.

05. සෘජුවම ව්‍යාපාරයේ ජංගම ගිණුමේ තැන්පත් කරන වටිනාකම හඳුන්වන්නේ,
(i) ණයගැති ප්‍රේෂණ ලෙස ය. (ii) සෘජු ප්‍රේෂණ ලෙස ය.
(iii) ස්ථාවර නියෝග ලෙස ය. (iv) සෘජු ආදායම් ලෙස ය.

06. ව්‍යාපාරයක සහනදායි පොලී ප්‍රතිශතයක් යටතේ ණය ලබා ගැනීම අයත් වන ව්‍යාපාර පරිසරය වන්නේ,
(i) දේශපාලන පරිසරය. (ii) ආර්ථික පරිසරය (iii) නෛතික පරිසරය (iv)ගෝලීය පරිසරය

07. නීතිමය පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධානයකි.
(i) සංස්ථාපිත සමාගම් (ii) රාජ්‍ය දෙපාර්තමේන්තු (iii) තනි පුද්ගල ව්‍යාපාර (iv)හවුල් ව්‍යාපාර

08. ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවාට උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

| **සංවිධාන වර්ගය** | **උදාහරණ** |
|---|---|
| 1. තනි පුද්ගල ව්‍යාපාර | A - සි/ස කුරේ සහ පුත්‍රයෝ පුද්ගලික සමාගම |
| 2. හවුල් ව්‍යාපාර | B - නිවි ෆැෂන් |
| 3. සංස්ථාපිත සමාගම් | C - පොල් සංවර්ධන මණ්ඩලය |
| 4. රාජ්‍ය සංස්ථා | D - රන්දික සහ පුත්‍රයෝ |

ඉහත ව්‍යාපාර සංවිදාන වර්ගය සඳහා උදාහරණ නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(i) B A D C (ii) B A C D (iii) B D A C (iv) B D C A

09. සුනිමල් වෙත ලැබෙන චෙක්පත පිටුපස සුනිමල්ගේ නම ලියා කමල්ට ලබා දෙන ලදි. මෙය හඳුන්වනු ලබන්නේ,

(i) අගරු වීම ලෙස ය. (ii) පිටසන් කිරීම ලෙස ය.
(iii) සාමාන්‍ය රේඛණය ලෙස ය. (iv) විශේෂ රේඛණය ලෙස ය.

10. පහත අවස්ථා ඇසුරෙන් සිල්ලර වෙලෙඳාමට උදාහරණයක් නොවන්නේ,

(i) අමල්ගේ නිවස ඉදිකිරීමට ගඩොල් නිෂ්පාදකයකුගෙන් ගඩොල් 30,000ක් ගැනීම.
(ii) සතිපොළේ වෙළෙන්දාගෙන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරිකයකු වූ කමල් එළවළු මිලට ගැනීම.
(iii) ගං වතුර සහනාධාර සඳහා වතුර බෝතල් 40,000ක් මිලට ගැනීම.
(iv) පාසල් ආපන ශාලාවෙන් පාසල් ළමුන ආහාර මිලට ගැනීම.

11. පහත සඳහන් වගන්ති අතරින් නිවැරදි වගන්තිය තෝරන්න.

(i) හරපතක් ලබා ගැනීම සඳහා වාණිජ බැංකුවක ගිණුමක් තිබිය යුතුය.
(ii) ණය කාඩ්පතක් ඕනෑම බැංකුවකින් ලබා ගත හැකි ය.
(iii) හර කාඩ්පත් හා ණය කාඩ්පත් වලින් ඕනෑම මුදල් ප්‍රමාණයක් ආපසු ලබා ගත හැකිය.
(iv) හර කාඩ්පත් භාවිත කර ATM යන්ත්‍ර මගින් මුදල් ලබා ගත නොහැකිය.

12. රක්ෂ්‍ය හිමිකම සම්බන්ධව වැරදි ප්‍රකාශණය තෝරන්න.

(i) ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර එකිනෙකාගේ ජිවිත පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.
(ii) දේපළ රක්ෂණයේ දි, එම දේපළ නීත්‍යානුකූළ අයිතිකරුවන්ට රක්ෂ්‍ය හිමිකමක් ඇත.
(iii) නීත්‍යානුකූල ණය ගනුදෙනුවකදී, ණය දුන් තැනත්තෙට දෙන ලද ණය ප්‍රමාණය දක්වා. ණය ලබා ගත් තැනත්තාගේ ජීවිතය රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.
(iv) ඕනෑම දරුවෙකුගේ ජීවිතය රක්ෂණය කිරීමට එම දරුවාගේ දෙමාපියන්ට රක්ෂ්‍ය හිමිකමක් ඇත.

13. ගුවන් පරිවහනයේ දැකිය හැකි වාසියක් වනුයේ,

(i) පිරිවැය අධික වීම ය. (ii) ඕනෑම අවස්ථාවකදී යොදා ගත හැකි වීම.
(iii) ගමනාන්තයට යා හැකි වීම ය. (iv) ඉක්මනින් ලගා විය හැකි වීම.

14. ව්‍යාපාරයක අරමුණු මුදුන්පත්කර ගැනීමේ දි සැලසුම් කරන ලද ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් තනතුරු හා වැඩ බෙදා හැරීම සම්බන්ධ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක් ද?

(i) සැලසුම්කරණය (ii) සංවිධානකරණය (iii) පාලනය (iv) මෙහෙයවීම.

15. ආයෝජයෙකු සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ හා ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ නිවැරදිව පිළිවෙලින් දැක්වෙන පිළිතු තෝරන්න.

(i) ප්‍රාග්ධන ලාභ, ලාභාංශ (ii) පොලී, ප්‍රාග්ධන ලාභ
(iii) ප්‍රාග්ධන ලාභ, පොලී (iv) ලාභාංශ, පොලී

16. යමුනා තමා ඉතිරිකර ගත් මුදලක් එලදායි මාර්ගයක ආයෝජනය කිරීමට අදහස් කරන්නී ය. ඇයගේ අපේක්ෂා පහත පරිදි වේ.

❖ ආයෝජනය සඳහා පූර්ණ ආරක්ෂාවක් ලබා ගැනීම ❖ අවදානම අඩුවීම
❖ මාස තුනක දී ආයෝජන මුදල් ආපසු ගැනීම.

ඉහත අපේක්ෂාවන් සියල්ල ඉටුකර ගැනිමට වඩාත් යෝග්‍ය ආයෝජන මාර්ගය වන්නේ,

(i) සාමාන්‍ය කොටස් මිලදී ගැනීම ය. (ii) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම ය.
(iii) දේපල මිලදී ගැනිම ය. (iv) ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කිරීම ය.

17. වත්කම් දෙකක වෙනස් වීමට බලපාන ගනුදෙනුව තෝරන්න.
(i) බැංකු ණයක් ගත්තා රු. 25,000
(ii) භාණ්ඩ තොග ණයට ගත්තා රු. 40,000
(iii) යන්ත්‍ර මිලදී ගත්තා රු. 80,000
(iv) විදුලි ගාස්තු ගෙව්වා රු. 8,000

18. මෝටර් රථ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සිදත් ලියනාරච්චි තම ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් ඉදිරිපත් කර ඇත.
❖ ඉෂාර මෝටර්ස් වෙතින් නවීන මෝටර් රථ දෙකක් ණයට ගැනීම
❖ රු. 6500,000 ක් වටිනා මෝටර් රථයක් සෙනවිරත්නට ණයට විකිණීම
❖ ව්‍යාපාරයට රු. 8,000,000 ක් වටිනා ඉඩමක් මිලට ගැනීම.

ඉහත ගනුදෙනු සටහන් කළයුතු මූලික සටහන් පොත් පිළිවෙලින් තෝරන්න.
(i) ගැණුම් ජ'නලය, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය
(ii) පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, මුදල් පොත
(iii) මුදල් පොත, ගැණුම් ජ'නලය, විකුණුම් ජ'නලය
(iv) ගැණුම් ජ'නලය, විකුණුම් ජ'නලය, මුදල් පොත

19. කිසියම් දිනකට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ වටිනාකම පහත දැක්වේ.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| 75,000 | | 50,000 | | 25,000 |

රු. 5,000ක කොමිස් ආදායමක් මුදලින් ලැබූ පසු ගිණුම්කරන සමීකරණයෙහි අගයයන් නිවැරදිව දක්වා අති පිළිතුර තෝරන්න.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (i) | 80,000 | = | 50,000 | + | 30,000 |
| (ii) | 75,000 | = | 50,000 | + | 25,000 |
| (iii) | 80,000 | = | 55,000 | + | 25,000 |
| (iv) | 70,000 | = | 50,000 | + | 20,000 |

20. ව්‍යාපාර ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට ආදේශ කර ඇති ආකාරය පහත දැක්වේ.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| | = | +20,000 | | - 20,000 |

ඉහත සමීකරණයට ආදේශ කර ඇති ගනුදෙනුව වන්නේ,
(i) 20,000ක් ණයහිමින්ට මුදල් ගෙවීම
(ii) රු. 20,000ක බැංකු ණය ව්‍යාපාරයට යෙදවීම.
(iii) රු. 20,000ක ණයහිමියකු අයිතිකරු විසින් පියවීම
(iv) රු. 20,000ක් ප්‍රාග්ධනය යෙදවීම.

21. විකුණුම් ජ'නලය ලෙජරයට පිටපත් කිරිමට අදාල නිවැරදි ජ'නල් සටහන් වන්නේ,
(i) ණයහිමි ගිණුම හර
විකුණුම් ගිණුම බැර
(ii) ණයගැති ගිණුම් හර
විකුණුම් ගිණුම බැර
(iii) විකුණුම් ගිණුම හර
ණයහිමි ගිණුම බැර
(iv) විකුණුම් ගිණුම හර
ණයගැති ගිණුම බැර

22. විකුණුම් සඳහා ලැබුණු රු. 8000ක් වටිනා චෙක්පත එම මොහොතේ ම බැංකුවේ තැන්පත් කරන ලදි. ඊට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,
(i) මුදල් පොත හර රු. 8,000
බැංකු ගිණුම බැර රු. 8,000
(ii) බැංකු ගිණුම හර රු. 8,000
ණයගැති ගිණුම බැර රු. 8,000
(iii) බැංකු ගිණුම හර රු. 8,000
විකුණුම් ගිණුම බැර රු. 8,000
(iv) විකුණුම් ගිණුම හර රු. 8,000
බැංකු ගිණුම බැර රු. 8,000

23. පහත සඳහන් ගනුදෙනු අතරින් විකුණුම් ජනලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,
(i) රු. 50,000 ක භාණ්ඩ ණයට විකිණීම
(ii) රු. 50,000ක භාණ්ඩ අත්පිට මුදලට විකිණීම
(iii) රු. 50,000ක ව්‍යාපාරයේ පාවිච්චි කළ යන්ත්‍රයක් ණයට විකිණීම
(iv) රු. 50,000ක ලී බඩු උපකරණ අත්පිට විකිණීම

24. සුරංගගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 3,000 කි. 2024 ජනවාරි මාසයේ සුළු වියදම් වල එකතුව රු. 2,800කි. 2024 පෙබරවාරි 01 දින සිට අග්‍රිමය රු. 3,500 දක්වා වැඩි කිරීමට තීරණය කරයි නම් සුරංගගේ ව්‍යාපාරයේ ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කීය ද?

(i) රු. 2,800 (ii) රු. 3,000 (iii) රු. 3,300 (iv)රු. 3,500

25. 2023.01.01 දින දිල්සර රු. 350,000ක ගොඩනැගිල්ලක් ද, රු. 200,000 උපකරණ ද, රු. 150,000ක මුදල් ද යොදා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. 2023.12.31 අවසන් වර්ෂයේ රු. 430,000 ආදායමක් ඉපයූ අතර රු. 240,000ක වියදමක් දරන ලදි. දිල්සර රු. 15,000ක මුදලක් පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගෙන ඇත. 2023.12.31 දිනට ව්‍යාපාරයේ හිමිකම වන්නේ,

(i) රු. 190,000 (ii) රු. 700,000 (iii) රු. 875,000 (iv)රු. 890,000

26. පහත සඳහන් දෑ අතරින් ප්‍රාග්ධන වියදමක් වන්නේ,

(i) පරිපාලන වියදම් (ii) මෝටර් රථ නඩත්තු වියදම්
(iii) නව යන්ත්‍රයක් සවි කිරීමට දරණ ලද වියදම් (iv) ව්‍යාපාරික ගොඩනැගිල්ල පින්තාරු වියදම්

27. ව්‍යාපාරයක 2024.01.31 දිනට බැංකු ගිනුමේ ශේෂය රු. 28,200ක්වූ අතර එදිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය රු. 32,500ක් විය. මෙම වෙනසට හේතු වූ ගනුදෙනුව කුමක් ද?

(i) බැංකුව අය කල බැංකු ගාස්තු රු. 4,300/-
(ii) තැන්පත් කල නිශ්කාෂණය නොවූ චෙක් රු. 4,300/-
(iii) බැංකුවට ලැබී ඇති සෘජු ප්‍රේෂණ රු. 4,300/-
(iv) ස්ථාවර නියෝග මත අයකර ගත් රක්ෂණ වාරිකය රු. 4,300/-

28. රු. 4,000/- ක ණයට විකුණුම්, අදාළ ගිණුම් දෙකේම බැරට සටහන් වී ඇත. මෙම වැරැද්ද නිසා ශේෂ පිරික්සුමට සිදු වූ බලපෑම වන්නේ,

(i) ශේෂ පිරික්සුමේ හරට රු. 4,000ක් අඩු වීම ය. (ii) ශේෂ පිරික්සුමේ බැරට රු. 4,000ක් අඩු වීම ය.
(iii) ශේෂ පිරික්සුමේ හරට රු. 8,000ක් අඩු වීම ය. (iv) ශේෂ පිරික්සුමේ බැරට රු. 8,000ක් අඩු වීම ය.

29. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක ගිණුම් තැබීමේ දී සිදුවූ වරදක් නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහනකි.

අවිනිශ්චිත ගිණුම හර රු. 5,000
ණයගැති ගිණුම බැර රු. 5,000

සිදුවී ඇති වරද වනුයේ,

(i) රු. 5,000ක ණයගැති ලැබීම්, ණයගැති ගිණුමේ පමණක් සටහන් වීම ය.
(ii) රු. 15,000ක ණයගැති ලැබීම්, ණයගැති ගිණුමේ රු. 5,000ක් ලෙස සටහන් වීම ය.
(iii) රු. 5,000ක ණයගැති ලැබීම්, ණයගැති ගිණුමේ හර පැත්තේ සටහන් වීම ය.
(iv) රු. රු. 5,000ක ණයගැති ලැබීම්, මුදල් පොතේ පමණක් සටහන් වීම ය.

30. සුපිරි ක්‍රීඩා සමාජයේ 2023.01.01 දිනට සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 10කි. 2023.12.31 දින වන විට 10 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නැත. ඒ අනුව ආදායම් ප්‍රකාශණයට අදාල සාමාජික මුදල වනුයේ,

(i) රු. 1,000 (ii) රු. 10,000 (iii) රු. 10,800 (iv) රු. 12,000

❖ පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්ණ අංක 31හා 32 ට පිළිතුරු සපයන්න.

අල්මාරි නිෂ්පාදන ආයතනයක අදාල පිරිවැය අයිතම කිහිපයක් පහත දැක්වේ.

❖ දැව
❖ යන්ත්‍ර අලුත්වැඩියා
❖ මෝස්තර නිර්මාණ සඳහා
❖ වඩු කාර්මික වැටුප
❖ වැලි කඩදාසි හා පොලිෂ්
❖ මුරකරු වැටුප්

31. ඉහත අල්මාරි නිෂ්පාදන ආයතනයේ සෘජු වෙනත් පිරිවැයක් වන්නේ,

(i) වඩු කාර්මික වැටුප (ii) දැව
(iii) වැලි කඩදාසි හා පොලිෂ් (iv) මෝස්තර නිර්මාණය සඳහා

32. ඉහත අල්මාරි නිෂ්පාදන ආයතනයේ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ගනනය කිරීමට අදාල අයිතම පමණක් ඇතුළත් පිලිතුර තෝරන්න.

(i) මෝස්තර නිර්මාණය සඳහා, මුරකරු වැටුප, යන්ත්‍ර අළුත්වැඩියා
(ii) දැව, වඩු කාර්මික වැටුප, මෝස්තර නිර්මාණය සඳහා
(iii) යන්ත්‍ර අලුත්වැඩියා, වැලි කඩදාසි හා පොලිෂ්, මුරකරු වැටුප්
(iv) වඩු කාර්මික වැටුප. දැව, වැලි කඩදාසි හා පොලිෂ්

33. ලැබිය යුතු පොලිය සටහන් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන
   (i) ලැබිය යුතු පොලි ගිණුම හර, මුදල් ගිණුම බැර
   (ii) මුදල් ගිණුම හර, ලැබිය යුතු පොලි ගිණුම බැර
   (iii) ලැබිය යුතු පොලි ගිණුම හර, ලද පොලි ගිණුම බැර
   (iv) ලද පොලි ගිණුම හර, ලැබිය යුතු පොලි ගිණුම බැර

34. ක්ෂය කිරීම නිවරදිව පැහදිලි කෙරෙන ප්‍රකාශය කුමක් ද ?
   (i) වත්කමේ වටිනාකමෙන් නිශ්චිත කොටසක් වාර්ෂිකව කපා හැරීම.
   (ii) ප්‍රාග්ධන වැයක්, එම වත්කමේ ජීව කාලය තුළදී අයභාර වැයක් බවට පත් කිරීම.
   (iii) වත්කමේ ගත් මිලෙන් නිශ්චිත ප්‍රතිශතයක් වාර්ෂිකව කපා හැරීම.
   (iv) වත්කම ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වාර්ෂික ලාභයෙන් කොටසක් අඩු කිරීම.

❖ පහත සඳහන් තොරතුරු උපයෝගි කරගනිමින් අංක 35 සිට 40 තෙක් ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
ශ්‍රීමාල්ගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ගිණුම් පොත් වලින් උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| තොගය 2023.01.01 දිනට | 20,000 |
| විකුණුම් | 400,000 |
| ගැණුම් | 200,000 |
| ගෙනඒමේ කුලි | 4,000 |
| යන්ත්‍ර (පිරිවැයට) | 500,000 |
| 2023.01.01 දිනට යන්ත්‍ර ක්ෂය වෙන්කිරීම | 50,000 |
| ණය ගැතියෝ | 10,000 |
| ණයහිමියෝ | 8,000 |
| ගෙවල්කුලි | 12,000 |
| ප්‍රචාරණය | 18,000 |
| බැංකු අයිරාව | 9,000 |
| විදුලිය | 5,000 |
| මුදල් ශේෂය | 10,000 |
| ලද වට්ටම් | 4,000 |
| දුන් වට්ටම් | 2,500 |

අතිරේක තොරතුරු :
❖ යන්ත්‍ර 10% බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතුය.
❖ 2023.12.31 දිනට ඉතිරි තොගය රු. 15,000
❖ මාසික ගෙවල්කුලිය රු. 1,500
❖ ණයගැතියන්ගෙන් රු. 1,500ක් බොල් ණය ලෙස කපා හරින්න.

35. මෙම ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණු බඩුවල පිරිවැය වන්නේ,
   (i) රු. 224,000 (ii) රු.191,000 (iii) රු. 209,000 (iv) රු. 220,000

36. මෙම ව්‍යාපාරයේ බෙදාහැරීමේ වියදමක් හා පරිපාලන වියදමක් පිලිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
   (i) ගෙනඒමේ කුලි, විදුලිය ගාස්තු (ii) ප්‍රචාරණ වියදම්, ගෙවල් කුලි
   (iii) දුන් වට්ටම්, ප්‍රචාරණ වියදම් (iv) ගෙනඒමේ කුලි, ගෙවල් කුලි

37. මෙම ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය වන්නේ,
   (i) රු. 100,000 (ii) රු. 191,000 (iii) රු. 101,500 (iv) රු. 106,000

38. ශ්‍රීමාල්ගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට යන්ත්‍රවල සමුච්චිත ක්ෂය ප්‍රමාණය කොපමණ ද?
   (i) රු. 50,000 (ii) රු. 100,000 (iii) රු. 400,000 (iv) රු. 450,000

39. 2023.12.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම වත්කම් වල වටිනාකම වන්නේ,
   (i) රු.35,000 (ii) රු. 25,000 (iii) රු. 54,000 (iv) රු. 33,500

40. 2023.12.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම වගකීම් වල වටිනාකම වන්නේ,
   (i) රු.15,000 (ii) රු. 33,000 (iii) රු. 23,000 (iv) රු. 17,000